# රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
# මිල ගණන් කැඳවීමයි

ප්‍රසම්පාදන අංකය - DMC/FIN/2021 (PROCU: 18)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 117 ඇමතුම් මැදිරිය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක වන ජාල පද්ධතියක් (Networking System) සැකසීම සඳහා සුදුසු සැපයුම්කරුවකුගේ සේවාව ලබාගැනීම වෙනුවෙන් වන ප්‍රසම්පාදනය සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙතින් මිල ගණන් කැඳවීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කර තිබේ.

ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධව ඔබ ආයතනය උනන්දුවක් දක්වන්නේ නම්, මේ සමඟ පහතින් දක්වා ඇති පිරිවිතරයන්ට අනුව වන ඔබ ආයතනයේ මුද්‍රා තැබූ මිල ගණන් 2021.06.21 දින පෙ.ව.10.30 හෝ ඊට පෙර "Network connectivity in Call Centre - DMC" යනුවෙන් ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කර සභාපති - ප්‍රසම්පාදන කමිටුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ප්‍රසම්පාදන ඒකකය, මුදල් අංශය, 3 වන මහළ, විද්‍යා මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් හෝ 3 වන මහලේ, මුදල් අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත ගෙනැවිත් බහාලන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

තවද, මිල ගණන් ඉදිරිපත් කිරීමේදී අප විසින් දක්වා ඇති පිරිවිතර ලේඛන සම්පූර්ණ කර, ඔබ ආයතනයේ බලයලත් නිලධාරියෙකුගේ අත්සන හා ආයතනයේ නිල මුද්‍රාව තබා මිල ගණන් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. (සම්බන්ධීකරණය - සම්පත් කුකුලේවිතාන මහතා 0718-084750 / 0772-084781)